ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2016 ජනවාරි 01 දින

ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

<u>ශ්‍රී ලංකාවේ මරණ දඬුවම අහෝසි කිරීම සඳහා වූ නිර්දේශය</u>

ගරු ජනාධිපතිතුමනි, පළමුව ඔබතුමන් වෙත නව වසරට අපගේ සුභපැතුම්.

මානව හිමිකම් මූලධර්මවලට සහ වටිනාකම්වලට ගැලපෙන වඩාත් මානුෂීය සමාජයක් සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම සාක්ෂාත් කරනු වස් මරණ දඬුවම ශ්‍රී ලංකාව තුළ අහෝසි කරන ලෙස නිර්දේශ කිරීමට මෙම සුබ දිනය අප අවස්ථාවක් කර ගන්නෙමු.

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 (ඇ) සහ (ඈ) වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්යය පටිපාටීන් සකස් කිරීම පිළිබඳව රජයට උපදෙස් දීම ද, ජාතික නීති සහ පරිපාලනමය පිළිවෙත් ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන් හා සම්මතයන්ට අනුකූල බව සහතික කිරීම පිණිස ගතයුතු පියවරයන් පිළිබඳව ද රජයට නිර්දේශ නිකුත් කිරීමේ කාර්‍යය පැවරී ඇත.

මරණ දඬුවම, ජීවිතයට ඇති අයිතිය ද කෲර සහ අවමන් සහගත දඬුවම් වලින් මිදී සිටීමට ඇති අයිතිය ද වෙනත් මානව හිමිකම් ද ප්‍රබල ලෙස උල්ලංඝනය කරනු ලබන දඬුවමක් ලෙසින් ද, අන්තගාමී වූත්, වෙනස් නොකළ හැකි වූත්, අපරාධ මර්දන ක්‍රමයක් ලෙස ප්‍රතිඵල විරහිත දඬුවම් ක්‍රමයක් ලෙසින් ද ලොව පුරා ඇතිව ඇති පිළිගැනීමෙන් මිදී සිටීමට ශ්‍රී ලංකාවට නොහැකි බව මානව හිමිකම් කොමිෂන් සභාව ගරු ජනාධිපතිතුමා සහ රජය වෙත මෙම නිර්දේශය ඉදිරිපත් කරමින් අවධානය යොමු කරයි. ජීවිතයේ ඇති වැදගත්කම සහ මූලික මානව හිමිකම් පිළිබඳ පවතින කැපවීම ශ්‍රී ලංකාව දැනට මරණ දඬුවම අහෝසි කර ඇති රාජ්‍යයන් 100 ක් සමඟ අත්වැල් බැඳගැනීම තුළින් ප්‍රත්‍යක්ෂ කළ යුතු වේ. තවත් රාජ්‍යයන් 60 ක පමණ මරණ දඬුවම දැනට ක්‍රියාත්මක නොවේ.

ශ්‍රී ලංකාව පිළිගෙන ඇති ජාත්‍යන්තර මානව හිමිකම් යුතුකම් යටතේ මරණ දඬුවම පැහැදිලිවම අධෛර්යමත් කෙරේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ තුන්වන වගන්තියට අනුව සෑම පුද්ගලයෙකුටම ජීවිතයට ඇති අයිතිය, නිදහස සහ පුද්ගල ආරක්ෂාව මඟින් මිනිස් ජීවිතයේ වටිනාකම පිළිගෙන ඇත. එමෙන්ම එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 6 වන වගන්තිය මඟින් මරණ දඬුවම අහෝසි කිරීමේ දැඩි අවශ්‍යතාවය යෝජනා කර ඇත.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 2694924
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 2689064
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මෙහිදී, 1989 දෙසැම්බර් 15 වන දින අංක 44/128 දරණ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමේ යෝජනාව අනුව සම්මත කරගත්තා වූ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ දෙවන වෛකල්පිත සංධානය කෙරෙහි ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරන්නෙමු. ඒ මඟින් මරණ දඬුවම අහෝසි කෙරේ. එහි පූර්විකාවට අනුව මරණ දඬුවම අහෝසි කිරීම මානව ගරුත්වය වැඩිදියුණු කිරීමට සහ මානව හිමිකම් හි ඉදිරි ප්‍රගමනයට දායක වේ. ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳ කැපවීම විදහාදැක්වීම සඳහා එම වෛකල්පිත සංධානය ස්වෛරී රාජ්‍යයක් ලෙසින් ස්ථිර කිරීමටත් මරණ දඬුවම අහෝසි කිරීමටත් කටයුතු කරන මෙන් අප නිර්දේශ කරන්නෙමු.

1976 සිට බලයට පත් රජයන් මරණ දඬුවම ක්‍රියාත්මක නොකිරීම අප අගය කරන මුත්, දණ්ඩ නීති සංග්‍රහය සහ 1984 අංක 13 දරණ පනතින් සංශෝධනය වූ වස, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත වැනි නීති යොදා ගනිමින් දිගින් දිගටම මරණ දඬුවම නියම කිරීම සිදුවන බැව් අප දන්නා කරුණකි.

ජාත්‍යන්තර හා තුලනාත්මක නීතියේ දැක්ම අනුව, මරණ දඬුවම කෲර අමානුෂික අවමන් සහගත දඬුවමක් බවත් එය මිනිස් ජීවිතයේ වටිනාකම නිශේධ කරන්නක් බවත් යන මතය සමඟ කොමිෂන් සභාව එකඟ වේ. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජීවිතයට ඇති හිමිකම මූලික අයිතිවාසිකමක් ලෙස ප්‍රකාශිතවම නොමැති වුවත්, එය ව්‍යංගයෙන් සහතික කොට ඇති බව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගෙන ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ වධහිංසාව කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකීම් සහ දඬුවම් තහනම් කර ඇත.

මරණ දඬුවම අහෝසි කිරීමේදී පහත කරුණු සැලකිල්ලට ගන්නා ලෙස ගරු ජනාධිපතිතුමා සහ රජයෙන් ගෞරව පූර්වකව කොමිෂන් සභාව ඉල්ලා සිටියි :

**(i). මරණ දඬුවම අපරාධ නිශේධන ක්‍රමවේදයක් ලෙස යොදා ගැනීම**

අපරාධ නිශේධන ක්‍රමවේදයක් ලෙස මරණ දඬුවම යොදා ගන්නා බවට බොහෝ මරණ දඬුවමට පක්ෂපාතී පාර්ශවයන් කරුණු දක්වයි. නමුත් ඵලදායී අධිකරණ පද්ධතියක් සහ සාධාරණ සමාජ වටපිටාවක් අපරාධ අඩු කරන හේතූන් බවත්, එවන් තත්ත්වයන් අපරාධ අනුපාතය අඩුව පවතින රටවල දක්නට ඇති බවත් අපගේ අදහස වේ. අපරාධ අනුපාතය අඩුවීමට හෝ අපරාධ වැළැක්වීමට මරණ දඬුවම හේතුවූ බවට පර්යේෂණාත්මක දත්ත නොමැත.

**(ii). යුක්තිය නිසි අයුරින් ඉටු නොවීමේ අවදානම හා මරණ දඬුවම ආපසු හැරවීමට නොහැකිවීම**

අභියාචනා කිරීම ද, නඩු විභාග කළ විනිසුරු වෙතින්, නීතිපති වෙතින් සහ අධිකරණ ඇමතිවරයා වෙතින් නිර්දේශ කැඳවීම වැනි ව්‍යවස්ථාමය ආරක්ෂණ ක්‍රමවේද තිබියදී වුවත් අපරාධයක් සිදු නොකළ අහිංසක පුද්ගලයන් මරණ දඬුවමට ලක්කිරීමේ අවධානම පවතින බව කොමිෂන් සභාවේ මතය වේ.

වෙනත් රටවල මෙන් අභියාචනා ක්‍රියාවලින් පසුව අපරාධ නඩුවක් නැවත විවෘත කිරීමට නොහැකි වීම නිසා අපරාධ යුක්ති ක්‍රියාවලිය තුළ පවතින අඩුපාඩු පදනම්ව යුක්තිය ඉටු කිරීමට නොහැකිවීමක් සිදුවිය හැකි බව ද කොමිෂන් සභාවේ මතය වේ. ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව සහ ව්‍යාවස්ථාපිත නීතිය යටතේ අපරාධ නඩු කටයුතු වලට නිසි ක්‍රමවේදයක් පැවතියත් අවසාන ප්‍රතිඵලයට බලපෑ හැකි මානව දෝෂයන් පැවතිය හැකිය.

ගරු ජනාධිපතිතුමනි, චූදිතයෙකු මරණ දඬුවමකට ලක්කර බොහෝ කාලයක් ඉක්මවූ පසුවත් අලුත් විමර්ශන ක්‍රමවේදයන් හා තාක්ෂණය හේතුවෙන් නව සාක්ෂි සොයාගැනීමට ද පළමුවන සාක්ෂිවල විශ්වසනීයත්වය පිළිබඳ ප්‍රශ්ණ මතු වූ බොහෝ අවස්ථාවන් ද අපට නිරීක්ෂණය වේ. එක්සත් ජනපදය, කැනඩාව සහ එක්සත් රාජධානියේ අවස්ථා කිහිපයකදී දෝෂ සහගත ලෙස

වරදකරු කළා වූ පුද්ගලයින් මරණ දඬුවම හෝ බන්ධනාගාර වලින් නිදහස් කිරීම ඉන් දශක කිහිපයකට පසුව ද සිදුකර ඇත. මෑතකදී එක්සත් ජනපදයේ ලුසියානා ප්‍රාන්තයෙන් එවන් සිද්ධියක් වාර්තා වේ. අපරාධ කීහිපයකට වැරදිකරු කර වසර 23 ක් බන්ධනාගාර ගතව සිටි පුද්ගගලයෙකු පසුගිය නොවැම්බර් මස නිදහස් කරන ලදි. ඊට හේතු ලෙස ඉදිරිපත් වුයේ සාධාරණ නඩු විභාගයක් සඳහා ඔහුට අවස්ථාව ලැබී නැති බවයි. මුල් නඩු විභාගයට සම්බන්ධ වූ ප්‍රධාන විමර්ශන නිලධාරියා සහ විනිසුරුවරයා යුක්තිය ඉටු කිරීමට නොහැකි වීමක් සිදුව ඇති බව විශ්වාස කරන බව පසුව ප්‍රකාශ කරන ලදි. මීට සමාන ලෙස ශ්‍රී ලංකාව තුළ ද පැමිණිල්ලේ ක්‍රමවේදයන් තුළ පවතින විෂමාචාර පදනම්ව අහිංසකයින් වැරදිකරුවන් කිරීම පිළිබඳව චෝදනා ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව අවධාරණය කරයි. විජේපාල එදරිව නීතිපති (2001) 1 SLR 42 ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව මඟින් මෙවන් තත්ත්වයක් ඉස්මතු කර දක්වා ඇත.

**(iii). චූදිතයින්ට නිසි ලෙස නිදහසට කරුණු කීමට ප්‍රමාණවත් අවස්ථාවක් නොමැතිවීම**

චූදිතයින් අඩු ආදායම් තත්ත්වයක සිටින විට, දක්ෂ නීතිඥයින්ගේ සේවය ලබාගැනීමට හැකි මූල්‍ය ශක්තියක් ඇති පුද්ගලයින්ට සාපේක්ෂව මරණ දඬුවමට ලක්වීමට වැඩි ප්‍රස්ථාව තිබෙන බව කොමිෂන් සභාවේ මතය වේ. සමහර චූදිතයින් වැරදිකරු වන්නේ එම වරදට වරදකරු වීම නිසාම නොව ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් කිරීමට නොහැකි නිසාය. මහාධිකරණය තුළදී චූදිතයින්ට නීතිඥ සහාය ලබාගැනීමට නොහැකි විට රජයේ වියදමින් පෞද්ගලික නීතිඥයෙක් පත්කරනු ලැබේ. බොහෝ විට මේ සඳහා තරුණ, නුපුහුණු, අත්දැකීම් අඩු නිතිඥයින් පත්කරන අතර ඔවුන්ගේ සේවාව සඳහා ප්‍රමාණවත් ගෙවීමක් ද සිදු නොවේ.

**ඉහත කරුණු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ දෙවන වෛකල්පිත සංධානයේ කොටස්කරුවන් වී මරණ දඬුවම වහාම අහෝසි කිරීමට කටයුතු කරන ලෙසට ශ්‍රී ලංකා රජයට නිර්දේශ කරනු ලබයි. මරණ දඬුවම වෙනුවට බන්ධනාගාර ගත කිරීම ආදේශ කළ යුතු වේ. එක් එක් අපරාධ වල බරපතලකම සලකා සිරගත කරන කාලය තීරණය කළ යුතුවේ. ඒ අනුව සිර දඬුවම් ලිහිල් කිරීමේදී ද ඒ එක් එක් අපරාධය හේතුවෙන් සමාජයට සිදුවන බලපෑම සලකා ජාතික ප්‍රතිපත්තියක් අනුව කටයුතු කළ යුතු බව ද නිර්දේශ කරමු.**

ඩී. උඩගම

ආචාර්ය එන්. ඩී. උඩගම
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත් : ගරු අගමැතිතුමා
ගරු කතානායකතුමා
ගරු විපක්ෂ නායකතුමා
ගරු අධිකරණ ඇමතිතුමා